**ගම්පොළ නගර සභාව - 2021**

----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

ගම්පොළ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඛණ්ඩව පැවත එන ශේෂ සනාථ කරගත නොහැකි රු.2,282,360 ක සේවක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු.1,350,000 ක කර්මාන්ත ණයහිමි ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් 06 දෙනෙකුට අදාළව එකතුව රු.1,741,032 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් වැඩියෙන් ගිණුම්ගත කර 2022 වසරේ නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | අවස්ථා 05 කට අදාළ කර්මාන්ත අතරුදවුම් රු.354,307 ක් හා අවස්ථා 06 කට අදාළ මිශ්‍ර තැන්පත් රු.9,837 ක් ලෙසට එකතුව රු.364,144 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | විදුලිය, ලිපිද්‍රව්‍ය හා වාහන අමතර උපාංග ඒකක 19 කට අදාළව තොග අගය රු.156,599 ක් වැඩියෙන්ද, කර්මාන්ත, විදුලිය, ලිපිද්‍රව්‍ය, ජල හා වාහන අමතර කොටස් ඒකක 27 කට අදාළව රු.318,129 ක තොග වටිනාකම අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | තොග පොත නිවැරදි කරන බවත් අඩුවෙන් ගිණුම්ගත කිරීම් ඉදිරියේදී නිවැරදි කරන බවත් දන්වා ඇත. | නිවැරදි තොග වටිනාකම ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අවස්ථා 02 ට අදාළ හිඟ හිට් කඩ කුලී ශේෂය රු.10,112,700 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අතපසුවීම නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ රු.268,678,501 ක ශේෂ හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන රු.196,811,678 ක ශේෂ අතර රු.71,866,823 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම්වලට හේතු සොයා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.15,782,429 ක වත්කම් විෂයයන් 03 කට අදාළ බදු කුලී ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් ඇති නොවන ලෙස කටයුතු කරන බව දන්වා ඇත. | විගණනයට අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) පාර්ලිමේන්තු පනත් | | | |
| (i) නගර සභා ආඥා පනතේ 157 (6) (උ) වගන්තිය | නගර සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු බැනර් හා ප්‍රචාරණ දැන්වීම් පුවරු සඳහා අයවිය යුතු රු.925,500 ගාස්තු අයකරගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii)නගර සභා ආඥා පනතේ 36 (ඉ) (ii) වගන්තිය | (I) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව සභාව සතු ඉඩමක් නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා දීර්ඝ කාලීනව බද්දට දී තිබුණි. | ඉදිරියේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය යුතුය. |
| | (II) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ගම්පොළ ශ්‍රී ලංගම බස් නැවතුම්පලේ කාමර 42 කින් සමන්විත සාප්පු සංකීර්ණයක් ඉදිකර එය පවත්වාගෙන යාමට පෞද්ගලික පාර්ශවයකට 2000 දෙසැම්බර් මස 29 වන දින සිට වසර 30 ක කාලයක් සඳහා, බද්දට දී තිබුණු අතර ගිවිසුම් අනුව සභාවට අයවිය යුතු රු.3,661,301 ක කුලියද අයකර නොතිබුණි. | තක්සේරු මුදල වැඩි බව පවසමින් බදු මුදල් ගෙවීම බදුකරුවන් ප්‍රතික්ෂේප කර ඇති බැවින් නව තක්සේරුවක් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. | තක්සේරුව අනුව කුලිය අයකර ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-----------------------------<br>මුදල් රෙගුලාසි 189 හා 486 | 2004 වසරේ සිට 2010 වසර දක්වා පාර්ශවකරුවන් 28 කින් ලැබුණු රු.563,753 ක චෙක්පත් අගරු වී තිබුණද ඒ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටද අදාළ කටයුතු කර නොතිබුණි. | සභාවේ තීරණය මත කමිටුවක් පත්කර කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2016 මාර්තු 03 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ V ඡේදය | සභාව තීරණය කරනු ලබන්නේ නම් පොදු වෙළඳපල කඩ කාමර බදු දීමට අදාළ එකවර ගෙවන මුදලින් සියයට 50 ක් ගෙවා ඉතිරිය මාස 06 ක් තුළ වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කළ හැකි වුවද, චක්‍රලේඛ උපදෙස් අනුගමනය නොකර පොදු වෙළඳපොල එකවර මුදල් අයකර ගැනීම පිළිබඳ විශේෂ කමිටුවේදී සියයට 25 ක් ගෙවා ඉතිරිය සමාන වාරික 48 කට ලබා ගැනීමට තීරණය කර තිබුණි. මේ හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 | ඉතිරි මුදල් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

දින වන විට රු.63,336,199 ක හිඟ මුදලක් අයකර ගැනීමට පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,847,288 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,198,035 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හා බදු හිඟය රු.59,682,577 ක් වූ අතර එම හිඟය තුළ රජයේ ආයතන 14 කින් අයවිය යුතු රු.17,321,170 ක ශේෂයක් පැවතුණි. | රජයේ ආයතනවල හිඟ නොගෙවීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව දන්වා ඇත. | පනතේ විධිවිධාන අනුව හිග වරිපනම් බදු අයකර ගැනීම සඳහා කටයුතු කළයුතුවේ. |
| (ආ) | ගම්පොළ පොදු වෙළඳපොළ සංකීර්ණයේ අංක 152 දරන කඩ කාමරයෙන් 2016 සිට අයවිය යුතු රු.6,000,750 ක එක්වන් මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන නොතිබුණි. | එක්වන් මුදල් අයකර ගැනීම සඳහා අදාළ කඩ හිමියා දැනුවත් කර ඇති බව දන්වා ඇත. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද සභාව සතු ඉඩම්, බද්දට ලබාගෙන තිබුණු බදුකරුවන් 155 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,874,472 ක බදු කුලී අයකර ගෙන නොතිබුණි. | බදු කරුවන් 155 දෙනාගෙන් බදුකුලී වශයෙන් 2022 ජූලි 31 දිනට රු.714,458 ක් අයකර ගෙන ඇති බව දන්වා ඇත. | බදු ගිවිසුම් අනුව බදු කුලී අයකළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව සභාව සතු කඩ කාමරවල කුලිය වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, සභාව සතු කඩ කාමර 2008 වර්ෂයෙන් පසුව තක්සේරු කර නොතිබුණි. | නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,614,423 ක වාහන 08 ක් සහ රජයේ නිවාස 03 ක් නිෂ්ක්‍රීයව සහ ඌන උපයෝජිතව පැවතුණි. | කම්පැක්ටර් රථයට අමතර කොටස් නොමැති බැවින් අලුත්වැඩියාව ප්‍රමාද වී ඇත. මහේන්ද්‍රා කැබ් රථය අලුත්වැඩියාවට ඇස්තමේන්තු කැඳවා ඇත. නිල නිවසක් අලුත්වැඩියාවටත්, නිවාස දෙකක් කඩා ඉවත් කර නව නිවසක් සෑදීමටත් කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් ප්‍රශස්ථව උපයෝජනය කළ යුතුය. |